# BELIEVERS EASTERN CHURCH WORLD HEADQUARTERS

Office of the Metropolitan, St. Thomas Community, Kuttapuzha P. O., Thiruvalla - 689103 Kerala, India.

## SHEPHERD’S LETTER

October/November 2024

**සියලු අගරදගුරුවරුන් සහ රදගුරුවරුන්, පූජකවරුන් සහ ඩීකන්වරුන්, ඉවැන්ජලිස්තවරුන් සහ කුරුසියේ සහෝදරියන්, සහ බිලීවර්ස් ඊස්ටන් චර්චිහි ලොව පුරා සිටින සියලුම විශ්වාසිකයින් වෙත, සැබෑ වූ එකම දෙවියන් වහන්සේ වන, පියාණන් වහන්සේගේ ද පුත්‍රයාණන් වහන්සේගේ ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ ද නාමයෙන් - ආමෙන්. ✠**

**ක්‍රිස්තුන් වහන්සේ තුළ සහෘදයිනි,**

ස්වභාව ධර්මයට සෘතු තිබෙන්නා සේම සභාවට ද සෘතු තිබේ. අපගේ ආත්මික වර්ෂය, උපවාස, මංගල්‍යයන් සහ යාච්ඤා විනය, නිරාහාරය, දන්දීම, වැනි ශික්ෂාවන් තුළින් අපව ඉතා දැඩි ලෙස ශක්තිමත්ව වර්ධනය කිරීමට නිර්මාණය කර තිබේ. උත්පත්ති 8:22 හි මෙසේ සඳහන්ව ඇත. “ පොළොව පවතින තෙක්, වැපිරීම හා කැපීම ද ශීත හා උණුසුම් ද සිසිර හා ගිම්හානය ද දවාල හා රාත්‍රිය ද නොකඩවා පවතිනු ඇත.” මෙම කාලවකවානු සහ වත්පිළිවෙත් ජීවිතයට බරක් නොව ආශිර්වාදයක් කර වෙමින් අපගේ ඇදහිල්ල සහ විශ්වාසයන් තුළ ශක්තිමත්ව වර්ධනය වීමට අපට උපකාර කරනු ඇත.

නොවැම්බර් මාසය නව නමස්කාර වර්ෂයක ආරම්භය සනිටුහන් කරනු ලබන අතර, ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුවෙන් ශුද්ධ වූ කාලය ආරම්භ කිරීම පිළිබඳව නිවේදනය කරනු ලබයි. මෙම කාලය පසුගිය වසර පිළබඳව සහ නව වසර පිළිබඳව මෙනෙහි කිරීමට සහ ආධ්‍යාත්මික කැපකිරීම් සකස් කිරීමට කදිම කාලයකි.

සමහර විට ඔබ, ශුද්ධ වූ වචනය කියවීම නොසලකා හරිමින්, දිව්‍ය පූජාවට සහභාගී වීම අතපසු කරමින් ආත්මිකව කම්මැලි වී සිටිනවා විය හැක. මෙම නව වසරේදී නොවරදවාම දිව්‍ය පූජාවට සහභාගිවී දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීමටත්, පවුලේ යාච්ඤාව ඉතා වගකීමෙන් යුතුව සිදුකිරීමටත් අදිටන් කර ගන්න. මෙම වසරේදී, දෙවියන් වහන්සේ ඔබට ලබා දී ඇති ත්‍යාග භාවිතා කරමින් ඔවුන් වහන්සේගේ සභාව ගොඩ නැගීමට සහ දෙවියන් වහන්සේගේ ප්‍රේමය අන් අය සමග බෙදා ගැනීමට සභාවේ සේවයට වඩාත් ක්‍රියාශීලීව දායකත්වය දක්වන්න.

දෙමාපියනි, සභාවේ දින දර්ශනය අනුගමනය කිරීමට ඔබේ දරුවන්ට උගන්වන ලෙස මම ඔබගෙන් ඉල්ලා සිටිමි. ඔවුන්ගේ ආත්මික වර්ධනය සිදුවන්නේ නිවස තුළිනි - එය ඔවුන්ගේ ජීවිතයේ අත්තිවාරමයි; සහ එමගින් කුඩා කල සිටම යාච්ඤා කිරීමට, නිරාහාරව සිටීමට, දන් දීමට සහ ඇදහිල්ලෙන් ජීවත් වීමට ඔවුන් ඉගෙන ගැනීම ඉතා වැදගත් දෙයකි. ශාන්ත පාවුළු අපෝස්තුළුතුමාගේ වචන මම තරුණ තරුණියන්ට ප්‍රතිරාව කරමි. "ඔබගේ තරුණකම නිසා ඔබ සුළු කොට සැලකීමට කිසිවෙකුට ඉඩ නොදෙන්න. ඔබේ කතාවෙන් ද හැසිරීමෙන් ද ප්‍රේමයෙන් ද ඇදහිල්ලෙන් හා පිරිසිදුකමින් ද අදහන්නන්ට ආදර්ශයක් වන්න." (1 තිමෝති 4:12)

ශුද්ධ වූ සභාව සහ ක්‍රිස්තුන් වහන්සේ තුළ අප මෙම නව වසරට ඇතුල් වන විට, එය 'කාලය සනිටුහන් කිරීමක්' ලෙස නොව, අපව නැවතත් කැපකිරීමේ අවස්ථාවක් ලෙස සිතා එයට ප්‍රවේශ වෙමු. අපගේ යෝජනාවන්, ලෝකයේ අයගේ මෙන් නොව, ඒවා මුල් බැසගෙන ඇත්තේ දෙවියන් වහන්සේගේ කරුණාව සහ ශක්තිය මත පදනම්ව වන අතර, මිනිස් කැමැත්ත මත පමණක් පදනම් වී නැත. එකමුතුව, ක්‍රිස්තුන් වහන්සේ තුළ එක ශරීරයක් ලෙස එකට සිටිමින්, ප්‍රීතියෙන් මංගල්‍යය සමරමින් සහ නිහතමානීව හා පසුතැවිල්ලෙන් යුතුව උපවාස පැවැත්වීම තුළින් අපි මෙම ඍතු හරහා ගමන් කරමු.

මෙම යාච්ඤාවෙන් මම ශාන්ත පාවුළුතුමා සමග එක්ව ඔබට යාච්ඤා කරමි. "ඇදහිල්ල කරණකොට ගෙන ක්‍රිස්තුන් වහන්සේ ඔබේ සිත් තුළ වාසය කරන පිණිස ද යාච්ඤා කරමි. තවද, ප්‍රේමයේ මුල් බැස, ස්ථිරව පිහිටා සිටින පිණිස ද යාච්ඤා කරමි. සියලු සැදැහැවතුන් සමග ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයේ දිගත් පළලත්, උසත්, ගැඹුරත් වටහා ගැනීමට ශක්තිය ලබා, ක්‍රිස්තුන් වහන්සේගේ ඥානාතික්‍රාන්ත ප්‍රේමය අවබෝධ කරගෙන, දෙවියන් වහන්සේගේ පරිපූර්ණතාවෙන් ඔබ පූර්ණ වන පිණිස ද

යාච්ඤා කරමි.”(එපීස 3:17-19) අප තුළ ක්‍රියාකරන ශුද්ධ වූ ත්‍රිත්වයාණන්ගේ අපිරිමිත බලය, සියලු ශාන්තුවරයන්ගේ සහ ශුද්ධ දේව මාතාවන්ගේ මැදිහත්වීම් තුළින් අපගේ ජීවිත තුළිනුත් සහ සභාව තුළත් ලෝකය තුළත් මහිමය ගෞරවය දැනුත් සදහටත් පුද කරමු - ආමෙන් ✠.

ක්‍රිස්තුන් වහන්සේ තුළ ඔබගේ පියාණන්,

මෝරන් මෝර් සාමුවෙල් තියෝපිලස්
මෙට්‍රොපොලිටන් හිමිපාණන්.

දිනය :2024 ඔක්තෝම්බර් මස
25 වෙනි දින

ස්ථානයඃ ලෝක මූලස්ථානය.

---

**සැ.යුඃ කරුණාකර මෙය සියලුම ප්‍රාදේශීය භාෂාවන්ට පරිවර්තනය කර විශ්වාසිකයින් දිරිගැන්වීම සඳහා සියලුම දේවස්ථාන වල කියවීමට කටයුතු කරන්න.**